# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1584/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 15/10/2024 පැය 1250

**මාධ්‍ය නිවේදනය**

**ආධුනික උප පොලිස් පරික්ෂකවරුන් හා පොලිස් කොස්තාපල්වරුන් විසිර යාමේ උත්සවය - කළුතර පොලිස් විද්‍යාලය.**

කළුතර පොලිස් විද්‍යාලයේදී මූලික පුහුණුව හදාරනු ලැබූ ආධුනික උප පොලිස් පරික්ෂකවරුන් 116 දෙනෙකු හා කළුතර, අරලගංවිල, නිකවැරටිය, ඇල්පිටිය, පහලගම හා කල්ලඩි පොලිස් විද්‍යාලවල පුහුණුව ලැබූ ආධුනික පොලිස් කොස්තාපල්වරුන් 1169 දෙනෙකු විසිර යාමේ උත්සවය 2024.10.14 වන දින කළුතර පොලිස් විද්‍යාල අළුවිහාර පිටියේදී ගරු මහජන ආරක්ෂක අමාත්‍ය විජිත හේරත් මැතිතුමාගේ, ප්‍රධානත්වයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා සහ වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

වසරකට ආසන්න කාලයක් මූලික පුහුණුව සාර්ථක ලෙස නිම කරන ලද මෙම නිලධාරීන් පොලිස් ස්ථාන වෙත රාජකාරි ලෙස පිටව යන අතර එම පුහුණුව සාර්ථක ලෙස නිමකර විසිරයන නිලධාරීන් අතරින් දක්ෂතම වෙඩික්කරු ලෙස ආධුනික උප පොලිස් පරීක්ෂක තරිඳු සඳරුවන්, ඇල්පිටිය පොලිස් විද්‍යාලයේ ආධුනික පොලිස් කොස්තාපල් 106155 සවිඳු නිම්සර යන නිලධාරීන් සම්මාන දිනා ගන්නා ලදී.

පුහුණු පාඨමාලාවේ නීතිය පිළිබඳව දක්ෂතම නිලධාරීන් ලෙස ආධුනික උප පොලිස් පරීක්ෂක තාරක නුවන් සංජීව, අරලගංවිල පොලිස් විද්‍යාලයේ ආධුනික පොලිස් කොස්තාපල් 106882 තරිඳු දීපාල් නුවන් කුමාර යන නිලධාරීන් සම්මාන දිනා ගන්නා ලදී.

මෙහිදී සෑම අංශයකින්ම දක්ෂතම ආධුනික උප පොලිස් පරීක්ෂකවරයා ලෙස ආධුනික උප පොලිස් පරීක්ෂක ලහිරු ලක්මාල් උඩත්තව නිලධාරියාත්, දක්ෂතම ආධුනික පොලිස් කොස්තාපල්වරයා ලෙස නිකවැරටිය පොලිස් විද්‍යාලයේ ආධුනික පොලිස් කොස්තාපල් 106645 ෂෙහාන් ගීත්මාල් පීරිස් නිලධාරියාත් සම්මානයට පාත්‍ර විය.

මෙම අවස්ථාවට උසස් පොලිස් නිලධාරීන්, විශ්‍රාමික පොලිස් නිලධාරීන්, සම්භාවනීය අමුත්තන් සහ විසිර යන පොලිස් නිලධාරීන්ගේ දෙමව්පියන් ඇතුළු විශලා පිරිසක් සහභාගි විය.






SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE
Follow Us
SRI LANKA POLICE


ALUVIHARE GROUND


SUPREME
NEWS




LUV




පොලිස් මාධ්‍ය කොට්ඨාසය.